2024.01.30 වෙනි දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේදී ,

නඩු අංකය - B[illegible] /2024

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 106 (2) හා 106 (3) වගන්තිය සමඟ කියවිය යුතු 106 (1) උප වගන්තිය යටතේ කරනු ලබන නියෝගයයි.

- පැමිණිලිකරු -

ආර්.එල්.එල් විජේරත්න,
ප්‍රධාන පොලිස් පරික්ෂක,
පොලිස් ස්ථානය,
කොටුව.

ඩබ්.එම්.කේ.ඩී කපිල විජේමාන්න,
ප්‍රධාන පොලිස් පරික්ෂක,
පොලිස් ස්ථානය,
කොම්පඤ්ඤවීදිය.

-එරෙහිව-

1) සජිත් ප්‍රේමදාස විපක්ෂ නායක
2) රංජිත් මද්දුම බණ්ඩාර පක්ෂ මහ ලේකම්.
3) ඒස් මරික්කාර් පාර්ලිමේන්තු මන්ත්‍රී.
4) කබීර් හෂීම් පාර්ලිමේන්තු මන්ත්‍රී.
5) හර්ෂන රාජකරුනා පාර්ලිමේන්තු මන්ත්‍රී.
6) සරත් පොන්සේකා පාර්ලිමේන්තු මන්ත්‍රී
7) ජේ සි අලවතුවල පාර්ලිමේන්තු මන්ත්‍රී.
8) තිස්ස අත්තනායක පාර්ලිමේන්තු මන්ත්‍රී.
9)ලක්ෂ්මන් කිරිඇල්ල පාර්ලිමේන්තු මන්ත්‍රී.
10) සුජීව සේරසිංහ පාර්ලිමේන්තු මන්ත්‍රී.
11)අශෝක අබේසිංහ පාර්ලිමේන්තු මන්ත්‍රී.
12) ආලන්ද පාලිත පාර්ලිමේන්තු මන්ත්‍රී.
13)හේෂා විතානගේ පාර්ලිමේන්තු මන්ත්‍රී.
14)කාවින්ද ජයවර්ධන පාර්ලිමේන්තු මන්ත්‍රී.
15) මුජිපර් රහුමාන් පාර්ලිමේන්තු මන්ත්‍රී
16) හිරුනිකා පේමචන්ද්‍ර

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 106 වගන්තිය ප්‍රකාරව කරනු ලබන ආඥාවයි.

කොටුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද කරුණු සලකා බැලීමෙන් පසුව අද දින අධිකරණය විසින් ලබා දෙන ලද නියෝගයේ සඳහන් හේතු අනුව අපරාධ නඩු විධාන සංග්‍රයයේ 106 (1) ප්‍රතිපාදන ප්‍රකාරව ආඥාවක් නිකුත් කර සිටිමි.

ඉහත නුඹලා විසින් හෝ නුඹලා විසින් මෙහෙයවනු ලබන නුඹලා සමග එක්ව ක්‍රියා කරන පුද්ගලයන් ඇතුළත් කණ්ඩායමක් විසින් ඒකරාශි කරගනිමින් 2024.01.30 වන දින පැය 0900 ත් පැය 2000 ත් අතර කාලයේ දී, කොටුව පොලිස් වසමේ සෙරමික් හංදිය සිට NSA

Scanned with CamScanner

ඉහත නුඹලා විසින් හෝ නුඹලා විසින් මෙහෙයවනු ලබන නුඹලා සමග එක්ව ක්‍රියා කරන පුද්ගලයන් ඇතුළත් කණ්ඩායමක් විසින් ඒකරාශී කරගනිමින් 2024.01.30 වන දින පැය 0900 ත් පැය 2000 ත් අතර කාලයේ දී, කොටුව පොලිස් වසමේ සෙරමික් හංදිය සිට NSA වටරවුම දක්වා මාර්ගය NSA වටරවුම සිට ගාලුමුවදොර ගාලමුවදොර වටරවුම දක්වාද DR විජේවර්ධන මාවතද කොම්පඤ්ඤවිදිය පොලිස් වසමේ ධර්මපාල මාවත සිට පිත්තල හංදිය දක්වාද බාලදක්ෂ මාවත සිට උත්තරානන්ද මවත දක්වාද මාර්ගය අවහිර නොකරන ලෙසත් මුදල් අමාත්‍යංශය, ජනාධිපති ලේකම් කාර්යාලය, මහ බැංකුව, ජනාධිපති මන්දිරයට ඇතුලුවීම වලකින ලෙසත් පොදු හා පුද්ගලික දේපලවලට හානි නොකරන ලෙසටත් 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ ix පරිච්ඡේදයේ ප්‍රතිපාදන පරිදි හා විශේෂයෙන්ම අපරාධ නඩු විධාන සංග්‍රහයේ 106(1) වගන්තිය ප්‍රතිපාදන ප්‍රකාරව ආඥාවක් නිකුත් කර සිටිමි.

තවද අපරාධ නඩු විධාන සංග්‍රහයේ 106(3) වගන්තිය ප්‍රකාරව අදාල නියෝග සම්බන්ධයෙන් ක්‍රියා කිරිමට පොලිසියට හැකියාවක් තිබෙන බවට සදහන් කරමි.

මෙම ආඥාව කඩ කිරීම එකී පරිච්ඡේදයේ සඳහන් පරිදි ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 185 වගන්තිය ප්‍රකාරව දඩුවම් ලැබිය හැකි වරදක් වනු ඇත.

මහෙස්ත්‍රාත්,
කොටුව.

මහෙස්ත්‍රාත්
කොටුව මහේස්ත්‍රාත් අධිකරණය
කොළඹ - 02.

Scanned with CamScanner